<u>**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිළ වෙබ් අඩවිය ජනතා පරිහරණයට මුදා හැරීම**</u>

ස්ථානය : කිංග්ස්බරි හෝටලය

දිනය : 2017 දෙසැම්බර් මස 20 වන බදාදා

වේලාව : පෙ.ව 9.00 සිට පෙ.ව 10.30 දක්වා

<u>**හැඳින්වීම**</u>

දූෂණය තුරන් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇති ප්‍රධානතම ආයතනය වන්නේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවයි.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ මූලිකාංග :




අපගේ නව වෙබ් අඩවිය

www.ciaboc.gov.lk

කොමසාරිස්වරුන් තිදෙනාගේ මූලිකත්වයෙන් වෙබ් අඩවිය නිළ වශයෙන් විවෘත කිරීම සිදුවූ අතර අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් වෙබ් අඩවියේ මූලිකාංග පිළිබඳව කරුණු පෙළගැස්වීමක් සිදු කරන ලදී.

<u>නව වෙබ් අඩවියේ විශේෂාංග</u>

- වෙබ් අඩවියේ මූලික ලක්ෂණයක් වශයෙන් වෙනත් රාජ්‍ය වෙබ් අඩවියක නොමැති ආකාරයට විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා (වර්ණ අන්ධතාවය හා පූර්ණ අන්ධභාවය ශ්‍රව්‍ය ආබාධ සහිත) පහසුවෙන් ප්‍රවේශ විය හැකි ක්‍රමෝපායන් මෙම වෙබ් අඩවිය තුළ පවතින බව පෙන්වා දෙන ලදී.

- වෙබ් අඩවියේ අකුරු වල ප්‍රමාණය විශාල කළ හැකිය.

- කොමිෂන් සභාව වෙත පැමිණිලි ඉදිරිපත් කිරීමේ ක්‍රමවේද 8ක් මෙම වෙබ් අඩවිය තුළ දක්වා ඇත.
  - පුද්ගලිකව පැමිණ
  - ලිපි
  - ක්ෂණික ඇමතුම්
  - ජංගම දුරකථනය ඇමතීම
  - කෙටි පණිවුඩ
  - ෆැක්ස්
  - විද්‍යුත් තැපැල
  - මාර්ග ගතව (online)

මාර්ග ගත පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා වෙබ් අඩවිය තුළ ආකෘති පත්‍රයක් ඉදිරිපත් කර ඇත.එම ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමෙන් පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.

- ඊට අමතරව වෙනත් සුවිශේෂාංග ලෙස උණුසුම් පුවත් ක්ෂණිකව ලබාදීම, කොමිෂන් සභාවට අදාල අධිකරණ නඩු දිනපොත, දින 15කට වරක් යාවත්කාලීන වන සංඛ්‍යාලේඛන තොරතුරු, ජාත්‍යන්තර සබඳතා තොරතුරු, නිවාරණය, ඉතිහාසය හා සමාජ කවුළුව යනාදී පහසුකම් මේ තුළ අන්තර්ගතය.එම කවුළුව තුළින් ළමුන්ට, තරුණයන්ට හා වැඩිහිටියන්ට අල්ලස හා දූෂණය පිළිබඳව දැනුමක් ලබාදීම සඳහා සකස් කරන ලද වැඩසටහන් ඇතුලත්ය.

<u>මාධ්‍ය සාකච්ඡාව</u>

කොමසාරිස්වරු තිදෙනාගේ හා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ මූලිතකත්වයෙන් පැවති මාධ්‍ය සාකච්ඡාවේදී කොමිෂන් සභාවට අදාල වැදගත් කරුණු රාශියක් මාධ්‍ය වෙත දක්වනු ලැබීය.අල්ලස් පනතේ 17 වන වගන්තිය මගින් තොරතුරු ලබාදීම කෙරෙහි දක්වා ඇති සීමාවන් පිළිබඳ කරුණු අනාවරණය කෙරිණි.එම සීමාවන්ට යටත්ව තොරතුරු ලබාදීමට කොමිෂන් සභාව විසින් පූර්ණ කැපවීමෙන් කටයුතු කරන බව මාධ්‍ය වෙත ප්‍රකාශ කෙරුණි.

තවද මුදල් විශුද්ධිකරනය වරද සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට ඇති සීමාවන් හා නිළධාරීන් මෙන්ම විශේෂඥයන්ගේ හිඟය සම්බන්ධ කරුණු ඉදිරිපත් විය.ඒ අනුව පවත්නා යල් පැන ගිය නීති සංශෝධනය

කිරීම, නව නිලධාරීන් බඳවා ගැනීම, නිවාරණය සඳහා වෙනම ඒකකයක් පිහිටුවා නිලධාරීන් අනුයුක්ත කිරීම යන කාරණා වල අවශ්‍යතාවය කොමිෂන් සභාව විසින් පෙන්වා දෙන ලදී.

<u>මාධ්‍ය සාකච්ඡාවේදී අසන ලද පැන හා ලබා දුන් පිළිතුරු</u>

විදේශ රටවල කොපමණ නීති විරෝධී වත්කම් රඳවා ඇත්ද යනුවෙන් මාධ්‍යවේදියෙකු අසනු ලැබූ පැනයකට පිළිතුරු ලබාදුන් අධ්‍යක්‍ෂ ජනරාල්තුමා පවසා සිටියේ ඒ සම්බන්ධව නිශ්චිතව පිළිතුරු දැක්වීම අසීරු බවත් ඒ සඳහා ඉහල මට්ටමේ අන්තර්ජාතික සබඳතාවයක් ගොඩනැගීම අත්‍යවශ්‍ය බවත්ය.

සුපිළිපන්නභාවය ඇති කිරීම සඳහා ඔබගේ ආයතනය ගෙන ඇති පියවර මොනවාද යන්න මාධ්‍යවේදියෙකු විසින් විමසූ විට අධ්‍යක්ෂජනරාල් තුමා පැවසුවේ වෙනත් රටවල මෙම කටයුත්ත සඳහා සුපිළිපන් නිලධාරීන් සිටින බවත් ඒ අනුවම යමින් සුපිළිපන් නිලධාරීන් බඳවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බවත්ය.

එම ප්‍රශ්නයටම පිළිතුරු දෙමින් කොමසාරිස් නෙවිල් ගුරුගේ මහතා පැවසුවේ බොහොමයක් රාජ්‍ය සේවකයින් වරදට පෙලඹෙන්නේ ඔවුන්ගේ මනස දූෂිත නිසා බවත් අපගේ නිවාරණ වැඩසටහන් වල අරමුණ රාජ්‍ය නිලධාරීන් තුළ සුපිළිපන්නභාවය ඇති කිරීම බවත්ය.එසේම කුඩා අවධියේ සිටම ළමුන් ඊට පෙළඹවිය යුතු බවද ඒ සඳහා පාසල් මට්ටමින් නිවාරණ කව ඇතිකරමින් ශිෂ්‍ය ප්‍රජාව මීට සම්බන්ධ කර ගනිමින් සිදුකර ඇති වැඩසටහන් සම්බන්ධයෙන්ද දක්වන ලදී.

වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා නොදීම සම්බන්ධයෙන් වන දඩ මුදල් පිළිබඳව ප්‍රශ්නයක් අසන ලද අතර මෑතකදී එවැනි චූදිතයෙකුට එරෙහිව රු 1000/- දඩයක් ලබා දීම පිළිබඳවද ප්‍රශ්න කරන ලදී.එයට පිළිතුරු දෙමින් අධ්‍යක්ෂ ජනරාල්තුමා පවසා සිටියේ වත්කම් බැරකම් නීතිය බලාත්මක වී ඇත්තේ 1975 වසරේ සිට බවත් එම යුගයට ගැලපෙන ලෙස දඩ මුදල් නියම වී ඇති බවත්ය.මේ වන විට මෙම නීති සංශෝධනය කිරීමේ උත්සාහයක නිරත වී සිටින බවද එතුමා දක්වන ලදී.

මාධ්‍ය සාකච්ඡාව අතරතුරදී කොමසාරිස් නෙවිල් ගුරුගේ මහතා කොමිෂන් සභාව පිළිබඳව නවතම පුවතක් දන්වා සිටින ලදී.එනම් කොමිෂන් සභාව කොළඹට පමණක් සීමා වී ඇති බැවින් එහි කටයුතු හා සම්බන්ධ වීමේදී ජනතාවට ඇතිවන අපහසුතා මගහැරීම සඳහා නුවර, මාතර හා අනුරාධපුර යන ස්ථාන වල කොමිෂන් සභාවේ ශාඛා ආරම්භ කිරීමට අදහසක් පවතින බවයි.

මෙම උත්සව අවස්ථාව පෙ.ව 11.00 ට පමණ නිමාවට පත්විය.